# පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය
## பாராளுமன்றச்சபைமுதல்வரின் அலுவலகம்
## OFFICE OF THE LEADER OF THE HOUSE OF PARLIAMENT

දිනය / திகதி / Date: 2021.05.13
මගේ අංකය / எனது இலக்கம் / My No.: LHP/PA/01-2021
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.:

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
සියලුම කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
අනෙකුත් විශේෂ වියදම් ඒකක ප්‍රධානීන්

**<u>පාර්ලිමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ අංක LHP2/P/AR-2020 හා 2020.11.27 දිනැති ලිපිය සම්බන්ධයෙන් කාරුණික අවධානය යොමු කරමි. (එම ලිපියේ පිටපතක් අමුණා ඇත)

යථෝක්ත ලිපිය මගින් පාර්ලිමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කිරීමේ දී මුද්‍රිත පිටපත් පමණක් ඉදිරිපත් කළ යුතු බවට ඔබ වෙත දන්වා ඇත.

තවද, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත මුද්‍රිත වාර්තා එනම්, කාර්ය සාධන වාර්තා, වාර්ෂික වාර්තා, ප්‍රගති වාර්තා, ස්ථාවර නියෝග 119(4) හා 120(4) යටතේ වාර්තා සහ වෙනත් වාර්තා ගරු මන්ත්‍රීවරුන්ගේ පරිශීලනයට හා පාර්ලිමේන්තු කාරක සභා වල භාවිතය සඳහා එක් එක් භාෂාවෙන් පහත දක්වා ඇති ප්‍රමාණයෙන් අවශ්‍ය බව පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් දන්වා ඇත.

- **එක් එක් භාෂාවෙන් වෙන් වෙන්ම මුද්‍රිත පිටපත් ඉදිරිපත් කරන්නේ නම් අවශ්‍ය පිටපත් සංඛ්‍යාව :**
  - සිංහල : 210
  - දෙමළ : 55
  - ඉංග්‍රීසි : 95

  එකතුව= 360

- **භාෂාත්‍රයම එක් පොතක මුද්‍රණය කර ඇත්නම් අවශ්‍ය වන පිටපත් සංඛ්‍යාව : 270**

ඒ අනුව, ඉදිරියේදී පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කිරීමේ දී උක්ත ප්‍රමාණයන්ගෙන් මුද්‍රිත පිටපත් එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් ද තවදුරටත් දන්වා සිටිමි.

හර්ෂ විජේවර්ධන
පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්
o/c

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ./இலங்கைபாராளுமன்றம்,ஸ்ரீ ஜயவர்தனபுரகோட்டே. /Parliament of Sri Lanka, Sri Jayewardenepura Kotte.
ලේකම් / செயலாளர் / Secretary: 011-2 777 463 / 011-2 777 464 / secretary@olhp.gov.lk
කාර්යාලය / அலுவலகம் / Office: 011-2 777 448/ 011-2 777 467 / 011-2 777 468 / www.olhp.gov.lk